දෙපාර්තමේන්තු කළමනාකරණ චක්‍රලේඛ ලිපි අංක : /2017

මගේ අංකය : සීජී/1/2/1ඒ/බඳවා ගැනීම/2016,
මිනින්දෝරු සේවා අංශය.

2017.02. 15 වන දින

අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ(මුදල්), / ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
පළාත් / නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන්,
මිනින්දෝරු අධිකාරිවරුන්,
සහකාර / කාර්යය නියුතු මිනින්දෝරු අධිකාරිවරුන්,
සහකාර අධ්‍යක්ෂ (පාලන),
රජයේ මිනින්දෝරුවරුන්,
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී,
පරිපාලන නිලධාරී,
කාර්මික හා පරිපාලන නිලධාරී,
සිතියම් නිෂ්පාදන නිලධාරී වෙත.

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීමේදී 10% ක් අභ්‍යන්තර නිලධාරීන්ගෙන් සම්පූර්ණ කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීමේ දී 10% ක් අභ්‍යන්තර බඳවා ගැනීම් සඳහා වන අයදුම්පත් කැඳවීමේ ලිපියේ හා ආදර්ශ අයදුම්පතේ පිටපතක් ඔබ යටතේ සේවයේ නියුතු අදාළ සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් දැනුවත් කිරීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

පී.එම්.පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවන් බඳවා ගැනීමේදී 10% ක් අභ්‍යන්තර නිලධාරීන්ගෙන් සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවීම – 2017**

අංක 1435/5 හා 2006.02.27 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට ඇතුළත් කරන ලද අංක 1675/20 හා 2010.10.12 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධනය පරිදි ආධුනික මිනින්දෝරුවන් බඳවා ගැනීමේදී මුළු බඳවා ගැනීම් වලින් 10% උසස්වීම් ක්‍රියාමාර්ගයක් ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ශ්‍රේණියෙහි සේවය කරන නියමිත අධ්‍යාපන සුදුසුකම් සහිත නිලධාරීන්ගෙන් සම්මුඛ පරීක්ෂණයක් මගින් පිරවීමට ප්‍රතිපාදන සැලසී ඇත.

ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි පහත දැක්වෙන සුදුසුකම් සහිත මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයට අයත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**යෝග්‍යතාව :-**

සෑම අපේක්ෂකයකුම ඔහු / ඇය :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත අයකු විය යුතුය.
(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 33 ට නොවැඩි විය යුතුය. ( ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1995.03.03 දින හෝ ඊට පෙර හා 1984.03.03 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි )

**අධ්‍යාපන සුදුසුකම් :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් මිනින්දෝරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හෝ ගණිතය හෝ භෞතික විද්‍යාව හෝ විෂයයක් වශයෙන් ඇති විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හෝ (අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී ගණිතය විෂයය සමත්ව තිබිය යුතුය.) සිවිල් ඉංජිනේරු උපාධියක් හෝ ලබා තිබිය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ශ්‍රේණින්හි සේවය කරන උක්ත සුදුසුකම් සහිත නිලධාරීන්ගෙන් සම්මුඛ පරීක්ෂණයක් මගින් පුරවනු ලැබේ.

**වැටුප් :**

මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (එම්. එන්. - 5 – 2016 ) අනුව රු 34605-10x660- 11x755-15x930-63460/- ක් වන අතර , එම වැටුප ඔබට හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට වැටුප් ගෙවනු ලැබේ.

**වෙනත් කොන්දේසි :**

ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන් මිනින්දෝරු දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුව සාර්ථකව නිමකර පුහුණු කාලය සමඟ වසර 04 ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සතුටුදායක ලෙස සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියට පත්කර සේවයේ ස්ථිර කරනු ලැබේ.

ආධුනික මිනින්දෝරු තනතුර සඳහා බඳවා ගනු ලබන ගණිතය හෝ භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇති විද්‍යාවේදී උපාධිධාරීන්, පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරීන් හෝ සිවිල් ඉංජිනේරු උපාධිධාරීන් මැනුම් විද්‍යා උපාධිය සාර්ථකව නිමකර පුහුණු කාලය සමඟ වසර 06 ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සතුටුදායක ලෙස සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියට පත්කර සේවයේ ස්ථිර කරනු ලැබේ.

ආධුනික මිනින්දෝරුවරුන් වශයෙන් පුහුණු කිරීම සඳහා තෝරා ගැනීමට ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ශ්‍රේණීන්හි නොමැති නම් එම පුරප්පාඩු ද විවෘත තරඟ විභාගයක් මගින් තෝරාගත් උපාධිධාරීන් බඳවා ගැනීමෙන් පුරවනු ලැබේ.

ඉහත දක්වා ඇති සුදුසුකම් ඇති තාක්ෂණ ශ්‍රේණීන්හි නිලධාරීන් පහත දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරන කරන ලද අයදුම්පතක් තම අධීක්ෂණ නිලධාරියා මගින් සර්වේයර් ජනරාල් , ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව (මිනින්දෝරු සේවා අංශය ) , කිරුල පාර , කොළඹ 05 යන ලිපිනය වෙත 2017.03.03 දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

දිනය :2017. 02 . 15

පී.එම්.පී.උදයකාන්ත
සර්වේයර් ජනරාල්
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව.

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට සීමිත පදනම යටතේ බඳවා ගැනීමේ අයදුම්පත - 2017

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

1.0 නම :

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම් වල මුලකුරු පසුවද යොදා නම:
( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) : ..............................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ..............................................................................

2.0 ලිපිනය :

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................

2.2 රාජකාරි ලිපිනය
(ඉංග්‍රීසි කැපිටල්අකුරෙන්) : ..............................................................................

3.0

3.1 දෙපාර්තමේන්තු සේවක අංකය : ..............................................................................

3.2 වර්තමාන තනතුර හා ශ්‍රේණිය : ..............................................................................

3.3 මුල් පත්වීමේ දිනය හා තනතුර : ..............................................................................

3.4 සේවය ස්ථිර කර ඇද්ද යන වග : ..............................................................................

4.0

4.1 ස්ත්‍රී පුරුෂභාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

4.3 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :- අවුරුදු ......... මාස ........ දින .......

5.0

5.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

6.0 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (උසස් පෙළ) විභාගය (අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී ගණිතය විෂයය සමත්ව තිබිය යුතුය )

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

7.0 ලබා ඇති උපාධිය - :

මිනින්දෝරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය - 1
භෞතික විද්‍යාව (ගණිතය ද ඇතුළුව) විද්‍යාවේදී උපාධිය - 2
පරිගණක විද්‍යාවේදී උපාධිය - 3
සිවිල් ඉංජිනේරු උපාධිය - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

8.0 උපාධිය පිළිබඳ විස්තර :-

(i) උපාධිය ලද දිනය : ........................................................................
(ii) විශ්ව විද්‍යාලය / ආයතනය : ........................................................................
(iii) ලියාපදිංචි වූ අංකය හා දිනය : ........................................................................
(iv) බාහිර / අභ්‍යන්තර : ........................................................................
(v) උපාධිය : ........................................................................
(vi) විෂයන් : ........................................................................
(vii) පන්තිය : ........................................................................
(viii) ඉහළ / පහළ : ........................................................................
(ix) විභාග අංකය : ........................................................................
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය : ........................................................................

9.0 පරිගණක විද්‍යාව පිළිබඳ හදාරා ඇති පාඨමාලා විස්තර :-

.......................................................................................................................................................................

10.0 වෙනත් සුදුසුකම් :-

.......................................................................................................................................................................
.......................................................................................................................................................................

11.0 කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් ඔබ වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ විස්තරය :-

.......................................................................................................................................................................

12.0 අයදුම්පත් භාර ගන්නා දිනට වැඩ තහනමකට ලක්ව තිබේ ද යන වග :-

.......................................................................................................................................................................

13.0 පූර්වාසන්න වසර පහ තුල සියළු වැටුප් වර්ධක උපයා ගෙන තිබේ ද යන වග :-

.......................................................................................................................................................................

මා විසින් ඉහතින් ඉදිරිපත් කර ඇති විස්තරය නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති විස්තරය කිසිවක් වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් , තෝරා ගැනීමට සලකා බලනු නොලබන බව හෝ සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම හොඳාකාරවම දනිමි.

..............................................
අයදුම්කරුගේ අත්සන

දිනය : .......................

අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය

.......................................................................................................................................................................
.......................................................................................................................................................................

දිනය:............................

..............................................
අධීක්ෂණ නිලධාරියාගේ අත්සන